# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01) කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)

සුදුසුකම් :

(1) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක්වරක දී සමත් වී තිබීම.

සහ

(2) අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් තුනක් සමත්වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

(3) පහතින් දක්වා ඇති සුදුසුකම් ලත් අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳව වසර දෙකක පළපුරුද්ද

සටහන : වයස - අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.
බඳවා ගැනීම - ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

වැටුප් පරිමාණය : රු. 49,475 - 17 X 540 - 58,655 (මාසික) [U-MN 1(III)]

### 02) රියදුරු (III ශ්‍රේණිය)

සුදුසුකම් :

(1) අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

(2) බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව යටත් පිරිසෙයින් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

සටහන : වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.
බඳවා ගැනීම - වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

වැටුප් පරිමාණය : රු. 48,005 - 16 X 490 - 55,845 (මාසික) [U-PL 3(III)]

### 03) නිවාස භාරකරු සහ අරක්කැමි (III ශ්‍රේණිය)

සුදුසුකම් :

(1) අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q.) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

හෝ

(2) අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

සටහන : වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.
බඳවා ගැනීම - වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වැටුප් පරිමාණය : රු. 44,575 - 16 X 490 - 52,415 (මාසික) [U-PL 2(III)]

### 04) වැඩ සහායක (III ශ්‍රේණිය)

### 05) ආරක්ෂක සේවක (III ශ්‍රේණිය)

### 06) උද්‍යාන සේවක (III ශ්‍රේණිය)

ඉහත අංක 04, 05 සහ 06 තනතුරු සඳහා

සුදුසුකම් :
අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම.

සටහන : වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.
බඳවා ගැනීම - වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වැටුප් පරිමාණය : රු. 42,775 - 16 X 450 - 49,975 (මාසික) [U- PL 1(III)]

මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් **https://ou.ac.lk** විවෘත විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියෙන් **(https://ou.ac.lk/staff-resources/ > Establishment Division > Application Non-academic)** හෝ විවෘත විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයට පැමිණ ලබා ගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට **2025.08.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ** එවිය යුතුය.

රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. **ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපහැදිලි බව, සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ
2025.07.13